# ප්‍රවෘත්ති නිවේදනය.

## PRESS RELEASE

## සෞඛ්‍ය අමාත්‍යාංශය.

## Ministry of Health

Telephone: Office: 2693919 Gen: 2694033, 2669192, 2675011, 2675449 Fax: 2689540

2015.04.07

**2015.04.06 වන දින කළුතර දිස්ත්‍රික් රෝහලේ නිරීක්ෂණ චාරිකාව සම්බන්ධන්ධයෙන් 2015.04.07 වන දින ලංකා සී නිවුස් වෙබ් අඩවියෙහි පළව ඇති පුවෘත්තිය සම්බන්ධයෙනි.**

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා පිඹුර රෝහල නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාව පිළිබඳ ලංකා සී නිවුස් වෙබ් අඩවිය විසින් පල කොට ඇති ප්‍රවෘත්තිය සපුරාම සාවද්‍ය බව අවධාරණය කරනු කැමැත්තෙමි. පිඹුර රෝහල් නිරීක්ෂණ චාරිකාව ඉතා උණුසුම් පිළිගැනීමක් සහිත අතිශය සාර්ථක විමංසනයක් විය. සී නිවුස් වෙබ් අඩවියේ සඳහන් වන කිසිදු ප්‍රතික්ශේප කිරීමක්, මාධ්‍යවේදීන් ආපසු හැරී යාමක් හෝ අසංවිධිත බවක් එම රැස්වීම තුළ නොතිබූ අතර එය ඉතා සාවධාන බවින් සංවිධාන කොට තිබූ නිරීක්ෂණ චාරිකාවක් විය. පිඹුර රෝහලේ සංවර්ධන කටයුතු පිළිබඳ වෛද්‍ය අධිකාරීවරයාත්, රෝහල් කමිටුවත්, වෛද්‍ය කාර්ය මණ්ඩලයත් සමඟ සාකච්ඡා කළ අමාත්‍ය රාජිත සේනාරත්න මහතා ඉදිරි සංවර්ධන හා ප්‍රවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගත හැකි ස්වරූපයන් පිළිබඳ මෙහිදී පැහැදිලි කරනු ලැබීය. පිඹුර රෝහල සඳහා තට්ටු තුනකින් සමන්විත අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් ලබා දීමට පියවර ගත් ගරු අමාත්‍යතුමන් එහි පළමු අදියර සඳහා රුපියල් මිලියන 50ක මුදල් ප්‍රතිපාදන ලබා දෙන බව සඳහන් කළේය.

ඉනික්බිතිව කළ්‍යාණ ශ්‍රී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහා නායක පූජ්‍යපාද ශාස්ත්‍රවේදී පිඹුර උදිත මහානායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් කෙටි උත්සව සභාවක්ද පැවැත්විණි. බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍ය රංජිත් සෝමවංශ මහතා, පිඹුර රෝහලේ වෛද්‍ය අධිකාරී පී. ඩී. ආර්. රොද්‍රිගෝ මහතා සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් රැසකුත් මෙම උත්සව සභාවට සහභාගී වූහ. සමස්ථයක් හැටියට ගත් කල මෙම නිරීක්ෂණ චාරිකාවට අන්තර්ගත වූ කළුතර නාගොඩ , බදුරලිය , පිඹුර , හොරණ හා බණ්ඩාරගම යන රෝහල් වල සංවර්ධනය සඳහා මෑත කාලයේ ඉහලම ප්‍රතිපාදනයන් ලබා දුන් අවස්ථාවක් හැටියද මෙම චාරිකාව හැඳින්විය හැකිය.

තතු මෙසේ තිබියදී පිඹුර රෝහල් නිරීක්ෂණ චාරිකාව සම්බන්ධයෙන් පළවඇති ප්‍රවෘත්තිය සපුරා අසත්‍ය හා සදොස් ප්‍රකාශනයක් බවද එපුවත නිදොස් කිරීමට ඔවුන් කටයුතු කරන්නේ නම් මාධ්‍යවේදීන් ලෙස අප වඩාත් සදාචාර සම්පන්න පියවරකට ප්‍රවේශවීමක් බවද අවසානයේ මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

ගරු අමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි
ලාල් ආනන්ද අබේධීර
ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්.

ලාල් ආනන්ද අබේධීර
ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.